**රුහුණ විශ්වවිද්‍යාලය**

**2018/2019 අධ්‍යයන වර්ෂය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි 2000 ස්ථලය**

**පළමු සමාසික පරීක්‍ෂණය - 2019 ඔක්තෝබර්/නොවැම්බර්**

**SLS 21513/21613 - සිංහල ව්‍යාකරණ සම්ප්‍රදාය**

ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න
(නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය).

**කාලය : පැය 03 යි**

---

1. සිංහල වර්ණ මාලාව සංස්කරණයට ලක් වූ අවස්ථා පැහැදිලි කරමින් වර්තමාන භාෂා ව්‍යවහාරයේ දී සිංහල අක්ෂර මාලාව ඇසුරෙහි පැනනැගී ඇති ගැටලු කවරේ දැ යි සාකච්ඡා කරන්න.

2. (i) **"පෙර'පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්"** යන පාඨය ඇසුරු කරමින් සිංහල භාෂාවේ සන්ධි හඳුන්වන්න.

   (ii) සිදත් සඟරාවේ දැක්වෙන සන්ධි විධි වර්තමාන සිංහල ලේඛන ව්‍යවහාරයට ප්‍රමාණවත් නොවන්නේ මන් දැ යි පරීක්ෂා කරන්න.

3. **"පණින් හඳන් යුත් පවසනුයෙ පුම ලිඟු වේ සහයොන් සතුන් කියෙලු සඳ වේ ඉතිරි ලිඟු නම්"** යන පාඨය පහදා සිදත් සඟරාවේ දැක්වෙන ලිංග විග්‍රහය කෙතෙක් දුරට ශාස්ත්‍රීය වූවක් දැ යි විමසන්න.

4. (i) ප්‍රත්‍යයාර්ථ ශබ්ද යනු කවරේ දැ යි පැහැදිලි කරන්න.

   (ii) තද්ධිත 'ඉ' ප්‍රත්‍යය යෝජනය සනිදර්ශන ව පහදන්න.

5. ප්‍රකෘති පිළිබඳ සිදත් සඟරා විග්‍රහය ඉදිරිපත් කරමින් එහි පවත්නා ගැටලු සාකච්ඡා කරන්න.

6. **'නාම යෝග්‍යකරණය'** වශයෙන් කුමාරතුංග දක්වන විභක්ති විග්‍රහය විමසුමට ලක් කරන්න.

7. සිදත් සඟරාවෙහි එන **"විදෑ වසින් තොර සිය දෑ වතට සම වත"** යන පාඨයෙහි අර්ථය පැහැදිලි කරමින් විශේෂණ සමාසය සහ විභක්ති සමාසය අතර බෙදුම් රේඛාව පිළිබඳ සාකච්ඡා කරන්න.

8. තෙකල් කිරිය (ත්‍රෛකාලික ක්‍රියා) පිළිබඳ සිදත් සඟරා විග්‍රහය විවේචනාත්මක ව විමසන්න.

**(සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි).**

@@@@@@@@@@